# සමාජ විද්‍යාව හා සමාජ මානව විද්‍යාව පිළිබඳ කෙටි හැඳින්වීමක්...

කථිකාචාර්ය අපරුක්කේ සුමංගල හිමි.

මනුෂ්‍යයා හා මිනිස් සමාජය පිළිබඳ ව ආනුභවික (Empirical) අධ්‍යයන කරන විද්‍යාත්මක විෂය ධාරාවන් අතර වැදගත් ස්ථානයක් මානව විද්‍යාවට හා සමාජ විද්‍යාවට ලැබේ. බටහිර රටවල් ආශ්‍රිතව 17-18 සියවස් වලදී ඇරඹුණු විද්‍යා ශාස්ත්‍ර නවෝදයේ උසස් ඵල දෙකක් හැටියට මෙම විෂයයන් දෙක හැඳින්විය හැකි ය. සමාජ ශාස්ත්‍ර ගණයට වැටෙන මෙම විෂයන් දෙක සම්බන්ධ නිර්දිෂ්ඨ ග්‍රන්ථවල එන විග්‍රහ අනුව අපට පැහැදිලි වන්නේ මානව සමාජය හා සංස්කෘතිය අධ්‍යයනය කරන ක්ෂේත්‍ර වශයෙන් ඒ වායේ අනන්‍යතාව වර්ධනය වී ඇති බවයි.

සමාජ විද්‍යාඥයින් හා සමාජ මානව විද්‍යාඥයින් කර ඇති ගවේශණ හා නිරීක්ෂණ මූලික වශයෙන් සමාන ද, එසේ නැතිනම් ඒ විග්‍රහ අතර ප්‍රධාන වෙනස්වීම් තිබේ ද යන්න විචාරාත්මකව සොයා බැලිය යුතු ය. න්‍යායාත්මකව බලන විට මෙම විෂයයන් දෙකෙන්ම සමාන සංකල්ප අධ්‍යයන කරන බව පෙනේ. එහෙත් යථාර්තමය වශයෙන් විමසා බැලුව හොත් සමාජ විද්‍යාව හා සමාජ මානව විද්‍යාව අතර සැලකිය යුතු වෙනස්කම් දක්නට ඇත. මේ වෙනස්කම් බොහොමයකට ඓතිහාසික හේතූන් බලපා ඇතැයි පැවසිය හැකි ය.

මානව විද්‍යාව පිළිබඳව පොදු පිළිගැනීම වන්නේ එය ශාරීරික මානව විද්‍යාව හා ජීව විද්‍යාව මුල්කරගත් පවුලෙන් උපන්නක්ය යන්න ය. සමාජ විද්‍යාව උපත ලැබුවේ ඉතිහාසය හා දර්ශනය මුල් කරගත් පවුලෙන් යැයි අදහස් කෙරේ. කෙසේ

වෙතත් මානව විද්‍යාවේ ආරම්භයට **චාල්ස් ඩාවින්ගේ** පරිණාමවාදි චින්තනය බෙහෙවින් බලපා ඇති බව ප්‍රකට කාරණයකි. සමාජ මානව විද්‍යාව බ්‍රිතාන්‍යයෙහි වර්ධනය වූයේ ඊට උරුම සංකල්ප පදනම් කර ගෙන ය. **රැඩ්ක්ලිෆේ බ්‍රවුන්** වැනි මානව විද්‍යාඥයින් සමාජය අධ්‍යයනය කරන විට වඩාත් උනන්දුවූයේ සමාජ ව්‍යුහය පිළිබඳව විග්‍රහ කිරීමට ය[1]. මේ අනුව බ්‍රිතාන්‍ය මානව විද්‍යාඥයන් සමාජ ව්‍යුහයට මුල් තැන දුන් බව පෙනේ. එහෙත් ඇමරිකන් මානව විද්‍යාඥයෝ සංස්කෘතිමය දෘෂ්ඨි කෝණයෙන් සමාජය අධ්‍යයනය කිරීමට උනන්දු වූහ. ප්‍රංශය ජර්මනිය වැනි යුරෝපීය රටවල මානව විද්‍යාව යනුවෙන් හඳුන්වාදී ඇත්තේ භෞතික මානව විද්‍යාවයි. බ්‍රිතාන්‍ය හා ඇමරිකානු මානව විද්‍යාඥයින් 'සමාජ හා සංස්කෘතික මානව විද්‍යාව' (Social - Cultural Anthropology) යන විෂයය යුරෝපීය රටවල හඳුන්වා ඇත්තේ 'මානවවංශ විද්‍යාව' (Ethnology) යන නමිනි.

සමාජ විද්‍යාව හා සමාජ මානව විද්‍යාව යන විෂයයන් දෙකම ආරම්භ වූයේ සමස්තයක් වශයෙන් මානව සමාජයේ ප්‍රභවය හා ස්වභාවය කුමක්ද යන්න ප්‍රශ්න කරමිනි. මේ විෂයයන් දෙක විද්‍යාත්මක ක්ෂේත්‍ර බවට පත්වූයේ ඒ ඒ සමාජ පිළිබඳ ආනුභාවික පරීක්ෂණ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. අද සමාජ විද්‍යාඥයින් හා සමාජ මානව විද්‍යාඥයින් අධ්‍යයන කරන සමාජ වර්ග එදා ඔවුන් අධ්‍යයනය කරන ලද සමාජ වර්ග වලට වඩා වෙනස් බව කිව යුතුවේ.[2]

ප්‍රාථමික, ප්‍රාග් ලිඛිත හෝ ගෝත්‍රික සමාජ අධ්‍යයනය කිරීම තුළින් බ්‍රිතාන්‍ය සමාජ මානව විද්‍යාව ආරම්භයේ සිටම එහි අනන්‍යතාව ගොඩනහා ඇති බව පැහැදිළි වේ. **රැඩ්ක්ලිෆ් බ්‍රවුන්** අන්දමන් දූපත් වලට හා ඕස්ට්‍රේලියානු ආදිවාසීන් වෙත ගොස් එහි සමාජ සමානතා අධ්‍යයනය කර ඇත. එසේම **මලිනොවුස්කි** ට්‍රෝබ්‍රියන්ඩ් (Trobriand) සමාජය ආශ්‍රයෙන් සිය අධ්‍යයනය කළේ ය. මලිනොවුස්කිගේ අනුගාමිකයන් බොහෝ දෙනෙකු තම මානව විද්‍යාත්මක අධ්‍යයනය කළේ අප්‍රිකාව ඇසුරු කර



ගෙන ය. විවිධ වූ ගෝත්‍රික සමාජවල සංස්ථා ඔවුන්ගේ අවධානයට යොමු විය. ඒවායේ සමානකම් මෙන්ම විවිධත්වය ද මොවුන්ගේ අධ්‍යයනයන්ට පාදක විය. සමාජ ජීවිතයේ මූලික මූලධර්ම තේරුම් ගැනීමට මෙය අවස්ථාවක් විය. දේශපාලනය ආගම හා ඥාතිත්වය පිළිබඳ වඩා උනන්දුවක් මේ යුගයේ සිටි මානව විද්‍යාඥයන් අතර විය. සමාජ මානව විද්‍යාවේ න්‍යාය වර්ධනයට පමණක් නොව යටත් විජිත පරිපාලනයට ප්‍රයෝගික වටිනාකමක්ද ලැබුනේ මේ ගෝත්‍රික සාමාජ අධ්‍යයනය කිරීම තුළිනි.[3]

ඇමරිකන් සමාජ විද්‍යාඥ **ජෝර්ජ් හෝමන්ස්** ප්‍රකාශකර ඇති ලෙස බ්‍රිතාන්‍ය මානව විද්‍යාඥයන් වැදගත් කොට සලකා ඇත්තේ ගොත්‍රික සමාජ මිස නවීන සමාජ නොවේ. මෙහි ප්‍රතිඵලය වූයේ බ්‍රිතාන්‍ය සමාජ විද්‍යා ගුරුකුලයක් වෙනුවට ප්‍රබල සමාජ මානව විද්‍යාත්මක ගුරු කුලයක් බිහි වීමයි.

ප්‍රාථමික සමාජ වල ඥාතිත්වය අධ්‍යයනය කරන මානව විද්‍යාඥයා ඒවා අධ්‍යයනය කරන්නේ එවන් සමාජවල එය තීරණාත්මක සාධකයක් වන නිසාය.[4] එහෙත් නවීන සමාජවල ඥාතිත්වයට වැදගත් තැනක් ලැබෙන්නේ නැත. ප්‍රාථමික සමාජයේ ඥාතිත්වය මානව විද්‍යාඥයාට යම්සේ වැදගත් වේද එලෙස නූතන සාමාජයේ පංති ක්‍රමය සමාජ විද්‍යාඥයාට වැදගත් වේ. පංති පිළිබඳව අධ්‍යයනය කරණ විට යුරෝපීය හා ඇමරිකන් සමාජ විද්‍යාඥයන් අතර වෙනසක් පවතී. යුරෝපීය සමාජ විද්‍යාඥයින් පන්තිය අධ්‍යයනය කරන්නේ මාක්ස්වාදී දෘෂ්ඨිකෝණයෙනි. සමාජ ගරුත්වය හා සමාජ ශ්‍රේණිය පදනම් කරගෙන ඇමරිකන් සමාජ විද්‍යාඥයෝ පන්තිය අධ්‍යයනය කරන ආකාරය දැක ගත හැකි ය. මානව විද්‍යාඥයින් මේ පිළිබඳව උනන්දු නොවන්නේ ගෝත්‍රික සමාජවල පංති හෝ ස්ථරායණ ක්‍රමයක් පැහැදිලිව දැක ගත නොහැකි නිසා ය.

ඥාතිත්වය පිළිබඳව සමාජ මානව විද්‍යාඥයින්ගේ අධ්‍යයන මඟින් හා පංතිය පිළිබඳව සමාජ විද්‍යාඥයින්ගේ අධ්‍යයන මඟිනුත් විශේෂ පර්යේෂණ රාශියකුත් ඒවාට අදල ක්‍රම වේදයන්

ද සංකල්ප හා පාරිභාෂික ශබ්ද මාලාවක් ද ගොඩ නැඟී තිබේ. ඇමරිකානු සමාජ හා මානව විද්‍යාඥයින් දෙස බලන කල මේ වෙනස පැහැදිලිව පෙනේ. ඥාතිත්වය පිළිබඳව න්‍යායන් සම්බන්ධව තමන්ට විශාරද දැනුමක් නැති බව බොහෝ සමාජ විද්‍යාඥයෝ පිළිගනිති. එසේම මානව විද්‍යාඥයින්ට සමාජ ස්ථරායණය හෝ පන්තිය අධ්‍යයනය කරන ශිල්ප හෝ විධි පිළිබඳ මනා දැනුමක් නොමැති බව පවසා ඇත. මෙය එක් අතකින් අවාසනාවන්ත තත්වයක් වන්නේ ඥාතිත්වය හා සාමාජ අසමතාවය පිළිබඳව ප්‍රශ්න මානව සාමාජය අධ්‍යයනය කරන අයට පොදු වටිනාකමක් තිබෙන නිසා ය.

සමාජ විද්‍යාව හා සමාජ මානව විද්‍යාව අතර ක්‍රම විද්‍යාත්මක වශයෙන් හඳුන්වාදිය හැකි වෙනසක් නම් ක්ෂෙත්‍ර අධ්‍යයන වලට මානව විද්‍යාඥයා උනන්දුවීම සහ සමාජ විද්‍යාඥයා සමීක්ෂණවලට වැඩි අවධානයක් දැක් වීමයි. ගෝත්‍රික සමාජ අධ්‍යයනයේ දී ක්ෂෙත්‍ර අධ්‍යයනය විශේෂයෙන් වැදගත්වේ. දත්ත එකතු කිරීමේදී, නිරීක්ෂණ ඇතිකර ගැනීමේ දී ඈත ප්‍රදේශවලට යායුතු වේ. සමහර විට වසරකට වැඩි කාලයක් ක්ෂෙත්‍රයේ සිට කරුණු ලබා ගැනීමට මානව විද්‍යානුකූලව සිදු වේ.[5] එසේ වන්නේ ගෝත්‍රික සමාජයේ ව්‍යවහාර කරණ භාෂාව මානව විද්‍යාඥයාට ආගන්තුක වීම ය. යම් සමාජයක් ගැන නිශ්චිත අවබෝධයක් ලබා ගැනීමට නම් භාෂාව සහ එහි විශේෂ රටා දැන ගත යුතු ය. ගෝත්‍රික සමාජයේ චින්තන රටාව එක මොහොතින් මානව විද්‍යාඥයාට තේරුම් ගත නොහැක. ඒ සඳහා කලක් එකට ජීවත් වීම අත්‍යවශ්‍යය සහභාගිත්ව නිරීක්ෂණය ගෝත්‍රික සමාජ අධ්‍යයනයේ ක්‍රම වේදයක් ලෙස භාවිත වේ.

බ්‍රිතාන්‍ය හා ඇමරිකන් සමාජ විද්‍යාඥයන්ට තමන් ජීවත් වන සමාජ අධ්‍යයනය කිරීමේ දී මෙතරම් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු නොවේ. ඔවුන්ට නුහුරු සංස්කෘතියක් අවබෝධ කර ගැනීමේ අවශ්‍යතාවය මේ නිසා මතු නොවේ. එහෙත් සංකීර්ණ කාර්මික සමාජයේ ඇතැම් අංශ අවබෝධ කර ගැනීමේදී සමාජ විද්‍යාඥයාටද පුළුල් පර්යේෂණ කිරීමට සිදු වේ. **ඩබ්ලිව්. එෆ්. වයිට්** පෙන්නා දෙන ලෙස ඔහු අධ්‍යයනය කළ ඇමරිකානු



මුඩුක්කු ලෝකය ඔහු ජීවත් වූ මධ්‍යම පන්තික පරිසරයට වඩා බෙහෙවින් වෙනස් බව පවසයි. සමාජ විද්‍යාව අපේ සමාජ පිළිබඳවත් සමාජ මානව විද්‍යාව අනික් අයගේ සමාජ පිළිබඳවත් අධ්‍යයන කරණ බව පැවසීම තරමක් දුරට සත්‍යයකි.

ඇතැම් විශ්වවිද්‍යාලවල සමාජ විද්‍යාව හා සමාජ මානව විද්‍යාව එකම අධ්‍යයනාංශයක් යටතේ උගන්වනු ලබන අතර, තවත් ඒවායේ වෙනම දෙපාර්තමේන්තු යටතේ එම විෂයයන් උගන්වයි. සමාජ විද්‍යාඥයා සමාජ අධ්‍යයන කිරීමේ දී ගණිත විද්‍යාත්මක ක්‍රම හා සංඛ්‍යා ලේඛන ක්‍රම භාවිත කරනු ලැබේ. තම අධ්‍යයනයට භාජනය වන නවීන සමාජයේ ආර්ථික, දේශපාලන සමාජීය පැවැත්ම පිළිබඳ නිවැරදි විවරණයක් ලබා ගැනීමට නම් අනිවාර්යයෙන් අවශ්‍ය වනුයේ ඵලදායී ක්‍රමවේද උපයෝගී කර ගැනීමයි. මෙහි ප්‍රතිඵල වශයෙන් සමාජ විද්‍යාඥයා සංඛ්‍යා ලේඛන ක්‍රම, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රම හා සමීක්ෂණ ක්‍රම ප්‍රයෝජනයට ගනී.

සමාජ විද්‍යාව හා සමාජ මානව විද්‍යාව අතර ඇති තවත් වෙනස් කමක් නම් සමාජ විද්‍යාඥයා සමස්ත සමාජයතම අධ්‍යයනය නොකිරීමයි. නූතන සමාජයේ එක් අංශයක් හෝ ප්‍රශ්නයක් පමණක් අධ්‍යයනයට හසු කර ගනී. එසේ අවධානයට හසු කර ගන්නා ප්‍රශ්නය පුළුල් ලෙස අධ්‍යයනය කිරීමට සමාජ විද්‍යාඥයා පෙළඹේ. එහෙත් මානව විද්‍යාඥයා තමන් අධ්‍යයනය කරන සමාජය සමස්ත ලෙස අධ්‍යයනය කරන බව පෙනේ. විශේෂයෙන් ගෝත්‍රික සමාජ වල සියලුම ලක්ෂණ හැකිතාක් දුරට ඔහු අධ්‍යයනය කරයි. **මැලිනොව්ස්කිගේ** කාලයේ සිට අද දක්වා ගෝත්‍රික සමාජ අධ්‍යයනය කළ මානව විද්‍යාඥයින් සෑම සමජායක්ම පුළුල් ලෙස අධ්‍යයනය කර ඇත. **රේමන්ඩ් ෆර්ත්** පොලිනීසියාවේ ප්‍රාථමික "**ටිකෝපියා**" සමාජය අධ්‍යයනය කළේ සමස්තයක් වශයෙනි. මේ නිසා සමාජ මානව විද්‍යාවේ "**සමස්ත එළඹුමක්**" තිබෙන බව පෙනේ.

සමාජ විද්‍යාව සමාජ සබඳතා ගැන විශේෂ අවධානයක් යොමු කරයි. සමාජ මානව විද්‍යාඥයාද සමාජ සම්බන්ධතා අධ්‍යයනය කරන අතර මිනිසුන්ගේ විශ්වාස අගනාකම් පිළිබඳව අධ්‍යයනය කරයි.

සමාජ විද්‍යාව හා සමාජ මානව විද්‍යාව අතර කලක සිට පැවති වෙනස ක්‍රමයෙන් දුරුවීමට හේතු පහළව ඇත. ප්‍රාථමික සමාජ අධ්‍යයනය කිරීමට අද අපහසුවී තිබේ. ක්‍රමයෙන් එවන් සමාජ වෙනස් වී ඇති අතර මේ නිසා වර්තමානයේ සමාජ මානව විද්‍යාඥයන් ගැමි සමාජ අධ්‍යයනය කිරීමට පටන් ගෙන ඇත. සමාජ මානව විද්‍යාඥයන් අද සංකීර්ණ සමාජයේ සංස්කෘතිය හා ඇගයීම අධ්‍යයනය කිරීමට ද උත්සාහ ගෙන තිබේ. ඒ අනුව නාගරික මානව විද්‍යාව නමින් උපවිෂය ක්ෂෙත්‍රයක් සමාජ මානව විද්‍යාව ක්ෂෙත්‍රයේ බිහි වී ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. A.R. Radcliffe Brown - Structure and Function in Primitive Society, London, 1952

2. Andre Beteille - Six Essays in Comparative Sociology, London 1974

3. Lucy Mair - An Introduction to Social Anthropology, 1965

4. A.R. Radcliff Brown and Daryll Forde - African System of Kinship and Marriage, London 1950

5. B. Malinowski - Argonauts of the Western Profile, London 1922